**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතුවකට අදාළව 2020 ඔක්තෝබර් 15 සිට දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු පොලිය රු.52,989 ක් ලැබිය යුතු පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීම නිසා එම ප්‍රමාණයෙන් ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාල ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | 2017, 2018 හා 2019 වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද මුද්දර උපලේඛන සැකසීමේ ගාස්තු රු.67,700 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හා සමාලෝචිත වර්ෂයට අදාල ගාස්තු රු. 96,800 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ශුද්ධ වියදම් එකතුව රු. 29,100 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු උප ලේඛන සැකසීම වෙනුවෙන් ගෙවීමට ඇති දිරි දීමනා මුදල් වර්ෂයේ වැය ශීර්ෂයෙන් ගෙවීමට සභා අනුමැතිය ලැබී ඇති බැවින් ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | පෙර වර්ෂයේ වියදම් සමුච්චිත අරමුදලට ගැලපීමද සමාලෝචිත වර්ෂයේ වියදම් වර්ෂයට අදාලව ගිණුම්ගත කිරීමද සිදුකළ යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු, උසාවි දඩ ආදායමෙන් ගෙවනු ලබන සියයට එකක දිරි දීමනා රු. 68,885 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශ අංක ඒ 9/උ/දඩ/04/03 දරන 2013 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛය මගින් 2014 ජනවාරි 01 දින සිට උසාවි දඩ වලින් පළාත් පාලන ආයතනයට ලැබෙන මුදලින් දිරි දීමනා ගෙවීම සඳහා මුදල් වෙන් කිරීම අහෝසි කර ඇති බව දන්වා තිබුණි. | සාවද්‍ය පිළිතුරක් වන අතර වර්ෂයට අදාල වියදම් ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සපිරි ගමක් ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මගින් කරනු ලැබූ කර්මාන්ත 87 ක් වෙනුවෙන් එම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු හා කර්මාන්තකරුවන්ට ගෙවිය යුතු රු.8,639,325 ක් ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම සකස් කරන විට ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් ගිණුම් ගත කළ යුතුයි. |
| (ඉ) | කර්මාන්ත ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් කර්මාන්ත 07 ක් සඳහා ලැබිය යුතු හා කර්මාන්ත කරුවන්ට ගෙවිය යුතු රු.2,683,765 ක් ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම සකස් කරන විට කර්මාන්ත ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් ගිණුම් ගත කළ යුතුයි. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.1,284,335 ක් වුවද ගිණුමේ එය රු.1,174,321 ක් ලෙස රු.110,014 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.957,231 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,172,460 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 94,143 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට හෝ අය කර ගත නොහැකි නම් කපා හැරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වා තිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කල යුතු අතර කපා හැරීම් සිදු කිරීමේදී විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 21,260 ක් විය. | තව දුරටත් ශේෂ පිළිබඳව සොයා බලා අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කල යුතු අතර කපා හැරීම් සිදු කිරීමේදී විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි. |
| (ආ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>----------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ශේෂය රු. 3,228,709 ක් පැවතුණි. | මෙම මුදල් ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් ලිපි යවා ඇති බව දන්වා තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |